පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර

සැප්තැම්බර් මාසය 02

ශ්‍රේණිය - 9

ර/කරවිට මධ්‍ය විද්‍යාලය

සැකසුම - එල්. මහේෂ් විජේවර්ධන

School Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

| | | |
|---|---|---|
| නිපුණතාවය | - | විවිධ මාධ්‍ය භාවිතා කරමින් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි |
| නිපුණතා මට්ටම | - | නෙළීමේ ශිල්පීය ක්‍රම භාවිතයෙන් උනත් කැටයම් නිර්මාණය කරයි. |
| ක්‍රියාකාරකම් | - | වෙස් මුහුණක් නිර්මාණය කරමු. |
| පැවරුම | - | පහත පියවර අනුව නිර්මාණකරණයේ යෙදෙන්න. |
| පියවර 1 | - | එක ඔබගේ නිවසේ හෝ අන්තර්ජාලය හරහා ලබාගත් විවිධ ශාන්තිකර්ම සඳහා යොදාගත් වෙස්මුහුණු වල රූප සටහන් කිහිපයක් සපයාගන්න. |
| පියවර 2 | - | එම රූප සටහන් වල ඇතුළත් වෙස් වෙස්මුහුණු වල ලක්ෂණ, හැඟීම් ප්‍රකාශනය, වර්ණය භාවිතය, ආදිය හොඳින් අධ්‍යයනය කරන්න. ඔබ කැමති සරලව නිර්මාණය කළ හැකි වෙස්මුහුණක් තෝරා ගන්න. |
| පියවර 3 | - | අඟල් 1 ඝනකම වර්ග අඩි 1 ක සෘජුෆෝම් කැබැල්ලක් ගෙන ඔබ තෝරාගත් වෙස් මුහුණේ දළ සටහනක් එහි පිටපත් කර පසුව එය වටා පේපර් කටර් හෝ කුඩා පිහිතලයක් භාවිතයෙන් කපා ඉවත් කරගන්න. මෙහිදී වැඩිහිටියෙකුගේ සහය ලබාගන්න. |
| පියවර 4 | - | එසේ කපා ගත් හැඩතලයේ ඇස් කුහර,නාසය,කට,කන් හිසකෙස් ආදිය සියුම්ව කුඩා පිහිතලේ භාවිතයෙන් කපා මතු කර ගන්න. |
| පියවර 5 | - | කපා අනවශ්‍ය කොටස් ඉවත් කරමින් කරමින් නෙලාගත් වෙස් මුහුණ වතුර මගින් දිය කළ හැකි දියරමය වර්ණ මාධ්‍යය මගින් නිර්මාණාත්මකව වර්ණ කරගන්න. |